# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2425/21 - 2025 පෙබරවාරි මස 25 වැනි අඟහරුවාදා - 2025.02.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2023/83.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2024.07.11 දිනැති හා අංක 2392/45 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.07.02 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පානදුර, නල්ලූරුව, ගාලු පාර, අංක 372 හි පදිංචි කේ.ජී.ඒ. ගුණසේකර මහතා සහ පානදුර, මෝදර විල, කර්මාන්තපුරය, අංක 36 හි පිහිටි ලංකා බ්‍රෂ් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/34/2024 හා 2024.12.18 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල් .

2025 පෙබරවාරි මස 18 වැනි දින,
කම්කරු දෙපර්තමේන්තුව,
කොළඹ 05.

1A - G 043833 - 18 (2025/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදීය.**

නඩු අංක A/34/2024
IR/COM/03/2023/83

කේ. ජී. ඒ. ගුණසේකර මහතා
අංක 372,
ගාලුපාර,
නල්លූරුව,
පානදුර

පළමු පාර්ශ්වය

එදිරිව

ලංකා බ්‍රෂ් එක්ස්පෝර්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ්,
අංක 36,
කර්මාන්තපුරය,
මෝදරවිල,
පානදුර

දෙවන පාර්ශ්වය

අතර පවතින කාර්මික ආරාවුල

**බේරුම්කරණ තීන්දු ප්‍රකාශය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා දරන පනත් වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල එකසිය තිස් එක්වන 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධන මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කරන ලදී.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ.

" ලංකා බ්‍රෂ් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ සේවය කරමින් සිටියදී 2020.05.12 දින සිට වැඩ තහනම් කරනු ලැබූ කේ. ජී. ඒ. ගුණසේකර මහතා 2020.07.21 දින නැවත සේවයෙහි පිහිටුවීමේදී වැඩ තහනම්කර තිබූ කාල සීමාව සඳහා වැටුප් නොගෙවීම සහ දැරූ තනතුරට අදාළ රාජකාරී ලබා නොදීම මගින් අසාධාරණයක් සිදුව තිබේද යන්නත් අසාධාරණයක් සිදුව තිබෙනම් ඔහුට ලැබිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ."

මෙම කාර්මික ආරාවුල සම්බන්ධයෙන් පැමිණිලිකාර පළමු පාර්ශ්වය වන කේ ජී.ඒ. ගුණසේකර මහතා හා වගඋත්තරකාර දෙවන පාර්ශ්වය වන ලංකා බ්‍රෂ් එක්පෝර්ට් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය මෙම බේරුම්කරණ අධිකරණය වෙත 2024.08.08, 2024.09.05, 2024.10.01 සහ 2024.10.10 දින කැඳවන ලදී.

පැමිණිලිකාර පාර්ශ්වය වන කේ.ජී.ඒ. ගුණසේකර මහතා තම පියා සමග ඉහත සෑම දිනකදීම බේරුම්කරණ අධිකරණයේ පෙනී සිටි අතර දෙවන පාර්ශ්වය වෙනුවෙන් ලංකා බ්‍රෂ් එක්ස්පෝර්ට් ප්‍රයිවට් ලිමිටඩ් හි පිරිස් කළමණාකරු වන නොයෙල් ප්‍රනාන්දු මහතා බලයලත් නියෝජිත වශයෙන් බේරුම් කරණ අධිකරණයේ පෙනී සිටින ලදී. දෙපාර්ශ්වය වෙනුවෙන්ම නීතිඥ සහායක් නොවීය. ඒ ඒ පාර්ශ්වයන් මෙම නඩුකරයේදී පළමු හා දෙවන විස්තර ප්‍රකාශන නියමිත පරිදි ඉදිරිපත් කරන ලද අතර නඩුකරයට භාජනය වන මූල්‍ය වටිනාකමේ ප්‍රමාණය සලකා බලා කිසියම් සමථයකට අවස්ථාව සලසා දෙන ලද නමුත් එම සමථ කොන්දේසි පළමු පාර්ශ්වය විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

පළමු හා දෙවන විස්තර ප්‍රකාශන ලබා ගැනීමෙන් අනතුරුව සාක්ෂි විභාගය සඳහා අවස්ථාව සලසා දෙන ලද අතර දෙපාර්ශ්වයේම නීතිඥ සහායක් නොමැති වීම හේතුවෙන් සාක්ෂි විභාගයට බාධා ඇති විය. ඒ අනුව සාක්ෂි විභාගයකින් තොරව මෙම බේරුම්කරණ අධිකරණය වෙත ලිඛිතව ඉදිරිපත්ව ඇති පළමු හා දෙවන විස්තර ප්‍රකාශන පාදක කොටගෙන බේරුම්කරණ තීන්දු ප්‍රකාශය ලබාදීමට ගරු බේරුම්කරණ අධිකරණය විසින් තීරණය කරන ලදී. එසේ කිරීමට එකඟතාවය දෙපාර්ශ්වය විසින්ම බේරුම් කරණ අධිකරණයේදී ලබාදෙන ලදී.

**තීන්දු ප්‍රකාශය**

ලංකා බ්‍රෂ් එක්ස්පෝර්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ සේවය කරමින් සිටියදී 2020.05.12 දින සිට වැඩ තහනම් කරනු ලැබූ කේ.ජී.ඒ. ගුණසේකර මහතා 2020.07.21 දින නැවත සේවයෙහි පිහිටුවීමේදී වැඩ තහනම්කර තිබූ කාල සීමාව සඳහා වැටුප් නොගෙවීම සහ දැරූ තනතුරට අදාළ රාජකාරී ලබා නොදීම මඟින් අසාධාරණයක් සිදුව තිබේද යන්නත් අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.

මෙම නීති කෘතියේදි පළමු පාර්ශ්වය හෙවත් කේ.ජී. ඒ. ගුණසේකර මහතා තම විස්තර ප්‍රකාශන තුළින් ඔහුට සිදු වූ අසාධාරණය බේරුම්කරණ අධිකරණය වෙත ඉදිරිපත් කර ඇත. එමෙන්ම වගඋත්තරකාර පාර්ශ්වය හෙවත් ලංකා බ්‍රෂ් එක්ස්පෝර්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය ද තම ලිඛිත විස්තර ප්‍රකාශන තුළින් මෙම බේරුම්කරණ අධිකරණ වෙත කරුණු වාර්තා කොට ඇත.

මෙම නඩුකරය බේරුම්කරණ අධිකරණය වෙත ඉදිරිපත් වීමට පෙර කම්කරු දෙපාර්තමේන්තුවෙහි නියෝජ්‍ය කම්කරු කොමසාරිස් කාර්යාලය (බස්නාහිර කලාපය 02) වෙත පැමිණිල්ලක් වශයෙන් ඉදිරිපත්ව තිබූ අතර ඒ සම්බන්ධව කම්කරු දෙපාර්තමේන්තු නිලධාරීන් පරීක්ෂණයක් සිදුකොට ඇත. එම පරීක්ෂණයෙන් පසු නියෝජ්‍ය කම්කරු කොමසාරිස් ටී. සී. ඒස්. වීරසිංහ මහතාගේ අත්සනින් අංක බස්. ක. 02/ බේරුම්කරණ 2021/06 හා 2023.01.11 දිනැතිව පහත සඳහන් පිළිතුරු යවා ඇත.

මගේ සමාංක හා 2022.09.28 දිනැතිව ඔබ වෙත ඉදිරිපත් කරන ලද තීරණය සම්බන්ධයෙන් අතෘප්තියට පත්වී ඇති බව සඳහන් කරමින් 2022.11.01 දිනින් යුතුව එවන ලද විරෝධතා ප්‍රකාශය සම්බන්ධයෙන් පහත පරිදි පැහැදිලි කිරීමක් සිදුකරමි.

1. වග උත්තරකාර සමාගමේ තොග ගණන් ගැනීමේ සේවා අවශ්‍යතාවයක් සඳහා සේවකයින් කැඳවීමේදී ඒ වන විට රටේ පැවති ඇඳිරිනීතිය සැලකිල්ලට ගෙන තොග ගනන් ගැනීම සඳහ කැඳවන සේවකයින්ට ඇඳිරි නීති බලපත්‍ර ලබාදීම ආයතනයේ වගකීමක් බව අවධාරණය කර ඇති අතර ගමනාගමන අපහසුතාවයන් පිළිබඳව කිසිදු ස්ථානයක් සඳහන්කර නැත.

2. මෙම පැමිණිලිකරුගේ සේවය අත්හිටුවා චෝදනාපත්‍රයක් එල්ලකර නිදහසට කරුණු විමසා ඊට පිළිතුරු සැපයීමෙන් අනතුරුව එය පිළිගත හැකිද නැද්ද යන්න පිළිබඳව සලකා බලා එය පිළිගත නොහැකිනම් විධිමත් විනය පරීක්ෂණයක් සිදුකල යුතුව ඇත. එසේ නොමැතිනම් ඉදිරිපත් කරන ලද නිදහසට කරුණු පිළිගත හැකිව තිබුනේ නම් එකී චෝදනාවෙන් පැමිණිලිකරු නිදහස් කළ යුතුව තිබුණි.එසේ කිසිදු පරීක්ෂණයකින් තොරව පැමිණිලිකරු සමාගමේ කොටසක් වන මිල්ලනිය කම්හලට ස්ථාන මාරු කර ඇත. ඒ අනුව පැමිණිලිකරු නිර්දෝශී අයකු ලෙස වගඋත්තරකාර සමාගම පිළිගෙන ඇති බව පැහැදිලිය. ඒ අනුව පැමිණිලිකරුගේ සේවය අත්හිටු වූ කාලයේ ඔහුට සේවය කිරීමට අවස්ථාව ලබා දුන්නේ නම් ඔහුට උපයා ගැනීමට හැකිව තිබූ වැටුප් ගෙවිය යුතු බව අවධාරණය කරමි. ඒ අනුව විනය පරීක්ෂණයක් නොපවත්වා සේවයෙන් පහකිරීමක් සිදු නොකර සිටීම තුළින් සේවකයා වැරදිකරු යැයි තීරණය කළ නොහැකිය.

3. විනය පරීක්ෂණයකින් අදාළ චෝදනාවට වරදකරු වුණි නම් වරදෙහි ස්වභාවය අනුව දඬුවම් නියම කළ හැකිය. නමුත් එසේ විනය පරීක්ෂණයක් සිදු නොකළේ තාක්ෂණික හේතුවක් (Technical Reason) මත බැව් වගඋත්තරකාර සමාගම දන්වා දඬුවමක් ලෙස සේවය අත්හිටු වූ කාලයේ වැටුප් නොගෙවීම අසාධාරණ හා අයුක්ති සහගත ක්‍රියාවක් බව අවධාරණය කරමි. තාක්ෂණික හේතුවක් මත විනය පරීක්ෂණයක් නොපැවැත්වීම මත පැමිණිලිකරුගේ නිදහසට ඉදිරිපත් කල කරුණු පිළිගත හැකි බව ගම්‍යමාන වේ.ඒ අනුව එකී චෝදනා පත්‍රයේ සඳහන් සියලු චෝදනාවන්ට පැමිණිලිකරු නිදොස් වී නිදහස් වී ඇති බව අවධාරණය කරමි.

4. රජයේ සේවකයෙකු මෙන්ම පුද්ගලික අංශයේ සේවකයෙකු වුවද සේවයේ යෙදී සිටියදී යම් විනය විරෝධී ක්‍රියාවක් සිදු කර ඇත්නම් ඒ පිළිබඳ අදාළ කාර්යය පරිපාටිය අනුගමනය කරමින් විධිමත් විනය පරීක්ෂණයක් සිදුකර චෝදනාවට චූදිත සේවකයා වරදකරුද නිවැරදිකරුද යන්න තීරණය කළ යුතුය. රජයේ සේවකයින්ට බලපාන ආයතන සංග්‍රහය අනුව පුද්ගලික ආයතනවලට ක්‍රියා කිරීම ප්‍රායෝගික නොවන බව පැහැදිලිය. නමුත් වගඋත්තරකාර සමාගම මෙම පැමිණිලිකරුගේ සේවය අත්හිටුවා 2020.05.12 දින ලිපියක් ලබාදී ඇති බවත්, ඊට අදාළ චෝදනා, පත්‍රයක් ලබා දී ඇති බවත් පිළිගනී. ඒ වගේම චූදිත සේවකයා ඊට නිදහසට කරුණු වගඋත්තරකාර සමාගමට භාර දී ඇති බවත් පිළිගනී. ඒ අනුව මෙම සේවකයාට එදිරිව විනය පරීක්ෂණයක් පවත්වා නොමැති බවද පිළිගනී. එසේම මෙම සේවකයාට දඬුවම් කිරීම ප්‍රායෝගික නොවන බවද දන්වා ඇත. එසේ තමා මෙම සේවකයාගේ සේවය අත්හිටු වීම, චෝදනා පත්‍රයක් ලබා දීම, නිදහසට කරුණු විමසීම සහ සේවය අත්හිටු වූ කාලයට හිඟ වැටුප් නොගෙවීමද ප්‍රායෝගික නොවන බව අවධාරණය කරමි. ඒ අනුව චෝදනා ලැබූ සේවකයාට එදිරිව විනය පරීක්ෂණයක් නොපවත්වා සේවය ලබා දෙන්නේ නම් ඔහු නිර්දෝශී පුද්ගලයෙකු ලෙස පිළිගැනේ.ඒ අනුව 2020.05.11 සිට 2020.07.21 දින දක්වා හිඟ වැටුප් නොගෙවීම අසාධාරණ බව අවධාරණය කරමි.

5. වගඋත්තරකාර සමාගම පැමිණිලිකරුට එරෙහිව සේවය අත්හිටුවා චෝදනා පත්‍රයක් එල්ලකර නිදහසට කරුණු විමසා එකී චෝදනාව සාධාරණ පරීක්ෂණයකින් ඔප්පු කිරීමට අවශ්‍ය විධිමත් විනය පරීක්ෂණයක් සිදු කිරීමෙන් වැළකී චූදිත සේවකයා වැරදිකරු යැයි තීරණය කිරීමට වගඋත්තරකාර සමාගමට කිසිදු නීතිමය ප්‍රතිපාදනයක් නොමැති බව

අවධාරණය කර සිටිමි. ඒ වගේම චෝදනා පත්‍රයේ සඳහන් අනෙකුත් චෝදනා සම්බන්ධයෙන් ද විධිමත් පරීක්ෂණයක් කර සාධාරණ සැකයකින් තොරව චෝදනා ඔප්පු කිරීමට වගඋත්තරකාර සමාගම අපොහොසත් වීම මත චෝදනා එල්ල කිරීම පමණක් පදනම් කරගනිමින් පැමිණිලිකරු වරදකරු යැයි උපකල්පනය කිරීම නීතියට පටහැනිය. ඒ අනුව පැමිණිලිකරු ඉහත චෝදනා පත්‍රයේ සඳහන් චෝදනාවන්ට වැරදිකරු කර නොමැති බැවින් ඔහු නිර්දෝශි පුද්ගලයෙකු බවත් ඒ අනුව නිර්දෝශී පුද්ගලයෙකුට හිමිවිය යුතු වරප්‍රසාද හිමිවිය යුතු බව දන්වා සිටිමි.

6. පැමිණිලිකාර සේවකයාට නගන ලද චෝදනාවන්ට අදාළව පවත්වනු ලබන විනය පරීක්ෂණයේදී සේවා සේවක දෙපාර්ශ්වය තමන්ගේ නිදහසට කරුණු විනය පරීක්ෂණ නිලධාරියා වෙත ඉදිරිපත් කිරීමේ අවස්ථාව සලසා දිය යුතුය. චූදිත සේවකයාට තමන්ගේ නිර්දෝශිභාවය ඔප්පු කිරීම සඳහා අවස්ථාව සලසා දිය යුතුය. එවැනි විනය පරීක්ෂණයක් සිදු නොකර වග උත්තරකාර සමාගම තම චූදිත සේවකයාට ද නොදන්වා "ඉල්ලුම්කරු සේවයෙන් පහ නොකර විකල්ප ක්‍රියාමාර්ගයක් ලෙස ඔහුට කිරීමට ඉඩ ලබා නොදුන් (සේවය අත්හිටුවා) කාලයට වැටුප් අහිමි කිරීමට යටත්ව මිල්ලනිය සේවා ස්ථානයට ස්ථාන මාරු කරන ලදී." යනුවෙන් සඳහන් කර ඇත. එකී තීරණ තම චූදිත සේවකයාට දැන්විය යුතු තිරණයකි. එකී තීෙය මෙම පරීක්ෂණය පැවැත් වූ අවස්ථාවේද මතු නොකළ බව මතක් කරදෙමි. ඒ අනුව මෙම අවස්ථාවේදී දන්වා සිටීම පිළිගත නොහැකිය.

7. පැමිණිලිකරුගේ තනතුර, ස්ථාන මාරුව සම්බන්ධයෙන් කිසිදු තීරණයක් ගෙන නොමැති බව දන්වා සිටිමි.

ඒ අනුව 2020.05.11 සිට 2020.07.21 දක්වා කාලය තුළ මෙම පැමිණිළිකරුට සේවය කිරීමට අවස්ථාව සලසා දුන්නේ නම් ඔහු සේවයට පැමිණ සේවය කර වැටුප උපයාගැනීමට ඉඩ ප්‍රස්ථාව තිබුණි. වග උත්තරකාර සමාගම එය අවහිර කළ බැවින් ඉහත කාලයට අදාල වැටුප් ගෙවීම සාධාරණ හා යුක්ති සහගත බැවින් කඩිනමින් අදාළ වැටුප පැමිණිළිකරුට ගෙවා වාර්තා කරන ලෙස මෙයින් දැනුම් දෙමි.

කරුණු අධ්‍යානය කරමින් කම්කරු නියෝජ්‍ය කොමසාරිස්වරයා විසින් ලබාදී ඇති ඉහත තීරණයේ සඳහන් කරුණු පිළිගැනීම යුක්ති සහගත සහ සාධාරණ බව මෙම බේරුම්කරණ අධිකරණයේද මතයයි. මෙම බේරුම් කරණ අධිකරණයේදී අවධානය යොමු වන්නේ වැඩ තහනම් කළ කාලයට අදාළව වැටුප සේවකයෙකු වෙත ගෙවීම සඳහා සේවායොජකයා යටත් වන්නේද යන්නයි. වැඩ තහනම් කල කාලයට අදාළ වැටුප් සේවකයෙකුට ගෙවීම සඳහා සේවා යෝජකයා යටත් වන්නේද යන්න Coats Thread Lanka (Pvt) Ltd Vs Ajith Upashantha Samarasundara Sc Appeal No 18/2009 නඩුවේ සඳහන් වේ. මෙම නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය තිරණ කලේ සේවකයෙකුගේ වැඩතහනම් කිරීමේ අයිතිය සේවා යෝජකයෙකු වෙත තිබුණද වැඩ තහනම් කල කාලය සඳහා වැටුප් ගෙවීමේ වගකීම සේවා යෝජකයෙකු වෙත පවතින බවයි. පැමිණිලිකරු විසින් ගරු බේරුම්කරණ අධිකරණය තුලින් අපේක්ෂිත සහනය වන්නේ ලංකා බ්‍රෂ් එක්ස්පොර්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ සේවය කරමින් සිටියදී 2020.05.12 දින සිට වැඩ තහනම් කරනු ලැබූ කේ. ජී. ඒ. ගුණසේකර මහතා 2020.07.21 දින නැවත සේවයෙහි පිහිටුවීමේදී වැඩ තහනම් කර තිබූ කාල සීමාව සඳහා වැටුප් නොගෙවීම සහ දැරූ තනතුරට අදාළ රාජකාරි ලබා නොදීම මගින් අසාධාරණයක් සිදුව තිබේද යන්නත් අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ. ඒ අනුව වැඩතහනම් කර සිටි කාලයට අදාල ගෙවිය යුතු වැටුප වූ රුපියල් 61,985,00 ක මුදල දෙවන පාර්ශ්වය වන ලංකා බ්‍රෂ් එක්ස්පොර්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය විසින් පළමු පාර්ශ්වය වන කේ.ජී. ඒ ගුණසේකර මහතාට ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කර සිටිමි.

මෙම මුදල මෙම ප්‍රදානය ගැසට් ගත වී මසක් ඇතුලත පානදුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු වේ. එමෙන්ම දැරූ තනතුරට අදාළ රාජකාරී යලි ලබාදීමට කර ඇති ඉල්ලීම මෙම ගරු බේරුම්කරණ අධිකරණය මඟින් ප්‍රතික්ෂේප කරමි.

මෙය සාධාරණ සහ යුක්ති සහගත තීරණයක් බව සඳහන් කරමි. ව්‍යවස්ථාපිත හිමිකම් අයදුම් කිරීමට මෙම ප්‍රදානය බාධාවක් නොවේ.

**ආචාර්ය කේ. ඒ. තිලකරත්න,**
බේරුම්කරු

2024 දෙසැම්බර් මස 18 වන දින,

EOG 02-0241

මගේ අංකය: IR/COM/01/2018/191.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.08.27 දිනැති හා අංක 2399/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.08.01 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පිළියන්දල, වැවල, දහම් පාසල් මාවත, අංක 02/02 හි පදිංචි පී. පද්මිණී ප්‍රනාන්දු මිය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් හෝමාගම, පිටිපන, මොරගහහේන පාර, අංක 37 හි පිහිටි ශ්‍රී ලංකා පාලි බෞද්ධ විශ්වවිද්‍යාලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 46/2024 හා 2025.01.15 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්.කේ.කේ.ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 පෙබරවාරි මස 08 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දීය.**

ගොනු අංකය - IR/COM/01/2018/191
නඩු අංකය - A/46/2024

*පළමු පාර්ශ්වය*

පී. පද්මිණී ප්‍රනාන්දු මිය,
අංක 02/02,
දහම් පාසල් මාවත,
වැවල,
පිළියන්දල.

පළමු පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටීම.

නීතිඥ පංචාලි ඒකනායක මිය
නීතිඥ චන්ද්‍රසිරි වනිගපුර මහතා
නිතිඥ තුසිත විජේකෝන් මහතා
නීතිඥ තිලණිකා විදාන පතිරණ මිය
නීතිඥ හෂාන් අබේරත්න මහතා

*සහ*

*දෙවන පාර්ශ්වය*

ශ්‍රී ලංකා පාලි බෞද්ධ විශ්ව විද්‍යාලය,
අංක 37,
මොරගහහේන පාර,
පිටිපන,
හෝමාගම.

දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටීම.

නියෝජ්‍ය ලේඛකාධිකාරි ඊ.ඒ. ගුණසේන මහතා
සහකාර ලේඛකාධිකාරී කේතකි අතපත්තු මිය
නිතිඥ හංසනි විජේසිංහ මිය
නීතිඥ සුපෙක්ෂලා තිලකවර්ධන මිය
නීතිඥ ගිම්හානි හිරුණිකා පෙරේරා මිය
නීතිඥ ඕෂිනි සේනාධිපති මෙනවිය
නීතිඥ යශාරා කොදාගොඩ මිය
නීතිඥ දිල්හානි රත්නායක මිය
නිති නිලධාරී එච්.ඩබ්ලිව්. නදිෂා දිල්රුක්ෂි මිය
සහකාර ලේඛකාධිකාරි මල්කා හේවාවිතාරණ මිය

ප්‍රදානය

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ගරු අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල අනුව 2024.08.01 වැනි දින හා අංක IR/COM/01/2018/191 ලිපියෙන් ඒ.බී. හේරත් වන මා බේරුම්කරු වශයෙන් පත්කොට මා වෙත යොමු කර ඇත.

ආරාවුලට තුඩුදුන් කාරණය

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කර ඇති උක්ත නියෝගය ප්‍රකාරව පහත සඳහන් දෙපාර්ශ්වය අතර, උද්ගත වී ඇති කාර්මික ආරාවුලයි.

මෙම ආරාවුලට හේතු වී ඇති කාරණය ලෙස කම්කරු කොමසාරිස් ජනරාල් එච්. කේ. කේ. ඒ. ජයසුන්දර මහතා විසින් නිකුත් කරන ලද ඔහුගේ අංක IR/COM/01/2018/191 හා 2024.07.29 දින ලිපිය අනුව ශ්‍රී ලංකා පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලයේ 2011.01.03 සිට 2016.01.03 දක්වා මූල්‍ය අධිකාරි ලෙස සේවය කළ පී. පද්මිණී ප්‍රනාන්දු මියගේ සේවය ස්ථිර නොකිරීම නිසා ඇයට අසාධාරණයක් සිදු වී තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ. "

පහත සඳහන් දිනයන් යටතේ නඩු අංක A/46/2024 යටතේ කාර්මික අධිකරණයට දෙපාර්ශ්වයම කැඳවා විභාග පවත්වා ඇත.

| | |
|---|---|
| 2022.02.14 | 2024.10.08 |
| 2022.02.24 | 2024.10.22 |
| 2022.04.08 | 2024.11.05 |
| 2022.09.15 | 2024.11.19 |
| 2023.02.08 | 2024.11.26 |
| 2023.03.13 | |
| 2023.04.28 | |
| 2023.05.29 | |
| 2023.07.20 | |
| 2023.10.03 | |
| 2024.09.10 | |
| 2024.10.02 | |

මෙම නඩුව පළමු වරට 2022.02.14 දින කැඳවා ඇත. ඉන්පසුව මෙම නඩුවේ බේරුම්කරු වශයෙන් කටයුතු කළ බේරුම්කරු වන නිතිඥ ජනජිත් ද සිල්වා මහතා ඉල්ලා අස්වී ඇත. (පිටු අංක 311) ඉන්පසු මා විසින් මෙම නඩුව 2024.09.10 දින කැඳවා ආරම්භ කළ අතර, දෙපාර්ශ්වයේම එකඟතාවය මත මෙම බේරුම්කරණය නැවතු තැන සිට ඉදිරියට පවත්වාගෙන යාමට එකඟතාවය පළ කරන ලදී. ඒ අනුව නඩුව පවත්වා 2024.12.10 දින නඩුව අවසන් කර ඇත:

**බේරුම්කරුගේ පසුබිම හා එය පැවැත්වූ ආකාරය**

ඉල්ලුම්කාරිය වන පී. පද්මිණී ප්‍රනාන්දු මිය ශ්‍රී ලංකා පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලයේ මූල්‍ය අධිකාරි තනතුර සඳහා, එම ආයතන පළකළ පුවත්පත් දැන්වීමකට අනුව, අයදුම්කර පසුව, සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වී 2011.01.03 දින සිට, මූල්‍ය අධිකාරි ලෙස බඳවා ගෙන ඇත. (පිටු අංක 17)

මෙම පත්වීම භාර ගන්නා විට ඉල්ලුම්කාරියගේ වයස අවු.53 මාස 09 ක් වේ. ඇයට වයස් සීමාව බලනොපා ඇත්තේ, රාජ්‍ය සංස්ථාවල සේවය කරන අයඳුම්කරුවන්ට උපරිම වයස අවු.45ට නොවැඩිවිය යුතුය, යන කොන්දේසි බල නොපවත්වා ඇත. (පිටු අංක 18) (ඇමුණුම් අංක 02)

ඇයගේ පත්වීම් ලිපියේ 02 පරිදි පරිවාස කාලය අවු. 03ක් බව සඳහන් කර ඇත. මේ අනුව ඇයගේ පරිවාස කාල සීමාව වන අවු 03 අවසන් වන්නේ 2014.03.01 වේ. එම දිනය වන විට වයස අවු.56යි. මාස 09 ක් වේ.

ශ්‍රී ලංකා පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලයේ 1981 අංක 74 දරන පනතට සංශෝධන වශයෙන් 1995 අංක 37 දරන සංශෝධිත පනතේ අංක 20 හි 23 (අ) වගන්තිය (පිටු අංක 24) වගන්තිය මගින් ආචාර්යය නොවන තනතුරක් දරන වයස අවු.55 සම්පූර්ණ වනතුරු එම ධූරයෙහි සිටිය හැකි අතර ඉන්පසු ඔහු ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගත් ලෙස සලකනු ලැබිය යුතුය. තවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කළ අංක 940 චක්‍රලේඛය මගින් සේවකයෙකුගේ වයස අවුරුදු 57 වනතෙක් සේවා දීර්ඝ කිරිමකින් සේවයේ යෙදීමට අවකාශ සලසා ඇත.

මේ අනුව 2012.03.31 දින වයස අවුරුදු 55 සම්පූර්ණ වන ඇය තව දුරටත් සේවය කිරීමට 2012.09.28 කළ ඉල්ලීම (පිටු අංකය 45,47) වන ඇමුණුම 03 330 වන පාලක සභාව විසින් 2013.03.31 සිට වසරක සේවා දිගුවක් ලබාදීම අනුමත කර ඇත. ඉල්ලුම්කාරියගේ වයස අවු.57 2014.03.31 යෙදී තිබූ බැවින් 2014.03.31 සිට තව වසරකින් සේවා දිගුවක් ඉල්ලුම්කාරිය ඉල්ලා සිටියත් ඇයගේ සේවා තත්ත්වය හා ඇයගේ පත්වීම ස්ථිර නොකර තිබූ නිසා ඇයගේ පරිවාස කාලය 2014.01.03 සිට මාස 06 කින් කාලය දීර්ඝ කිරීම යටතේ ලබා දීමට 343 පාලක සභාව අනුමක කර ඇත.

350 වන පාලක සභාව විසින් තවදුරටත් අඩුපාඩු සකස් කර ගැනීමට යටත්ව 2014.07.13 සිට මාස 06කට කාලය දීර්ඝ කර අනුමත කර ඇත.

355 වන පාලක සභා තීරණය සළකා බැලීමේ දී (ඇමුණුම් 09) ඉල්ලුම්කාරිය 2015.01.03 දින සිට විශ්‍රාම ගැන්වීමටත් එදින සිට ඉදිරියට, වසරක කොන්ත්‍රාත් පදනම් මත ඇය සේවයට බඳවා ගැනීමටත් එමෙන්ම දැනට පුරප්පාඩු තනතුර පිරවීමටත් අදාළ උපදෙස් ලබාදී ඇත.

363 පාලක සභාව ( පිටු අංක 53) එයින් ඉල්ලුම්කාරියගේ සේවය ස්ථිරකර නොමැති බැවින් පනතේ විධිවිධාන අනුව සේවා දිගුවක් ලබාදිය හැක්කේ. ස්ථිර කාර්යය මණ්ඩලය සඳහා පමණක් වන බවට තීරණය කර ඇත. මේ අනුව ඇයගේ සේවය 2016.01.03 දින අවසන් කිරීමට තීරණය කර ඇත. (ඇමුණුම 10)

ඉල්ලුම්කාරිය සේවය ස්ථිර නොවූ අයකු බැවින් (ඇමුණුම් 12) අනුව ඇයට විශ්වවිද්‍යාල වෛද්‍යාධාර හිමි නොවේ. එමෙන්ම ඇයගේ සේවය ස්ථිර කර නොමැති බැවින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක UGC/HR/5/3/33 හා 1995.01.06 ලිපිය අනුව (පිටු අංක 79) පරිදි ඇයට විශ්‍රාම පූර්ව නිවාඩු ද හිමි නොවේ. 2016.04.01 දින දක්වා දෙවන පාර්ශ්වය විසින් ඇයට, සේවක අර්ථ සාධක අරමුදල් වශයෙන් රු.8.76860.01 (අට ලක්ෂ හැත්තෑ හය දහස් අටසිය හැටයි ශත එකක් ගෙවා (අකුරින්) (ඇමුණුම් 14) තවද ඇයගේ සේවක අර්ථ සාධක අරමුදල් ප්‍රමාදය වෙනුවෙන් රු.2,01739.96ක් 2017.01.20 ගෙවා ඇති බව තහවුරු වේ. (පිටු අංක 69)

අලුතින් ගෙවීමට සේවක අර්ථ සාධක අරමුදලේ ඉතිරියක් නොමැති බවට නිගමනය කරමි.

පර්යේෂණ වාර්තා පිළියෙල කිරීමට අදාලව නිකුත් කර ඇති DMS/CIR/2013/Research හා 2014.02.11 දින දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ 2/2014 03 යටතේ තමාට හිමි බවට, ඉදිරිපත් කළ කරුණු අධිකරණය ඉදිරියේ තහවුරු කිරීමට ඉල්ලුම්කාරිය අපොහොසත් වී ඇත. ඉල්ලුම්කාරිය තම ඉල්ලීම පමණක් අධිකරණයට ඉදිරිපත් කර ඇතත්, එය ඉදිරි කටයුතු සිදු කළ බවත් ගම්‍ය නොවේ. මේ අනුව ඇයට පර්යේෂණ දීමනාවට අදාළ 35% ප්‍රදානයක් කිරීමට ප්‍රමාණවත් හේතු සාධක නොමැති බව නිගමනය කරයි.

එමෙන්ම ඉල්ලුම්කාරියගේ සේවය ස්ථිර කර නොමැති බැවින් ඇයට වාහන බලපත්‍රයක් ද හිමි නොවන බව නිගමනය කරන අතර ඇය මූල්‍ය අධිකාරී විසින් බඳවා ගැනීමේ දී ඇය අලුත් සේවිකාවක් වශයෙන් බඳවාගෙන ඇති බව පෙනී යන අතර එනිසාම ඇයගේ පෙර සේවා කාලය මේ සඳහා ගණනය නොවන බව ද සඳහන් කරමි.

එමෙන්ම ඉල්ලුම්කාරිය මෙම අධිකරණයේ දී තමාට අවවාදාත්මක ලිපියක් නිකුත් කළ බව පිළිගෙන ඇත. (R8) තවද (R4 ) හා (R5) අධිකරණයේ සලකුණු කල ලේඛනවලට අනුව ඇයගේ කාර්යය සාධනය වර්ධනය කර ගැනීමට පරිවාස කාලය මාස 6න් 06 ට දීර්ඝ කළ බව ඇය පිළිගෙන ඇත.

**නිරීක්ෂණ හා නිගමනයන්**

ඉල්ලුම්කාරිය, තම පරිවාස කාලය තුළ, මූල්‍ය අධිකාරී වශයෙන් කටයුතු කරමින් සිටියදී ඉදිපත් කළ 2012.12.31 අවසන් වර්ෂයට අදාලව ඇය විසින් පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශන පිළිගත නොහැකි බව. විගණන දෙපාර්තමේන්තුව විසින් 2013.03.04 වැනි දින හා BC/E/BPU/ අ.ගි 2012 ලිපියෙන් උපකුලපති මහෝපාධ්‍යයන් වහන්සේ වෙත දන්වා ඇත.

මේ පිළිබඳ 337 පාලක සභාවේ බලවත් අප්‍රසාදය පලකර ඇති අතර, විශ්වවිද්‍යාල කීර්ති නාමයට හානියක් මෙන්ම විශ්වවිද්‍යාලයේ පරිපාලනය විවිධ අපහසුතාවලට පත් වූ බව දන්වමින් ඉල්ලුම්කාරියට තරයේ අවවාද කර 2013.07.01 දින අංක BPU/AB/-02/ PN/11/118 ලිපිය පද්මිණී ප්‍රනාන්දු මියට යවා ඇති බව පෙනීයන අතර මෙම කාර්මික අධිකරණයේ දී ඉල්ලුම්කාරීය පිළිගෙන ඇත. (ඇමුණුම 05) (පිටු අංකය 50)

මේ අනුව ඇයගේ පරිවාස කාලය, දෙවන පාර්ශ්වයේ දෝස දර්ශනයට ලක්ව ඇති අතර මේ අනුව ඇයගේ සේවය ස්ථිර කර නොමැති බවට නිගමනය කරමි. මේ අනුව ඉල්ලුම්කාරියගේ ලිඛිත දේශනයේ සඳහන් කර ඇති (a,b,c,d,e,f,g,h,I,j) අනු අංකය යටතේ ඉල්ලුම්කාරිය ඉල්ලා සිටින සහනයන් ඉහත නිගමනයන් මත ඇයට හිමි නොවන බවට නිගමනය කරමි.

**ප්‍රදානය**

ඉහත කාරණා හේතුවෙන් කාර්මික නීතියේ ඉහළින්ම පිළිගැනෙන යුක්ති සහගත හා සාධාරණය නිගමනයන් වශයෙන් ඉල්ලුම්කාරීයට කිසිදු ප්‍රදානයක් කිරීමට හේතු සාධක නොමැති බැවින් ඇයගේ ඉල්ලුම්පත්‍ර කිසිදු තීරණයකට නොඑලැබෙමින් ප්‍රතික්ෂේප කරමි.

**ඒ. බී. හේරත්,**
බේරුම්කරු.

2025 ජනවාරි මස 15 වැනි දින.
බේරුම්කරණය හා කාර්මික ශාඛාවේ දීය.

EOG 02-0242

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.